රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/01චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2022.06. 16

චක්‍රලේඛ අංකය : 07 /2022

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මඟින්

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

<u>උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම අලුතින් නම් ඇතුලත් කිරීම.</u>

උප්පැන්න ලේඛනවල නම් වෙනස් කිරීම හා අලුතින් නමක් ඇතුලත් කිරීම සම්බන්ධයෙන් මෙතෙක් නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ මෙයින් අහෝසි කරන අතර , මෙම චක්‍රලේඛය පමණක් ඉදිරියට බලාත්මක වේ.

02. 1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27 වන වගන්තිය යටතේ නම් සංශෝධනය සඳහා පුද්ගලයන්ට අයිතියක් ඇත.මේ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අත්පොතෙහි III කාණ්ඩයේ 292 සිට 330 දක්වා නියෝග කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන අතර එම නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා පහත උපදෙස් ලබා දෙමි.

03. වයස අවුරුදු 07ට අඩු දරුවකුගේ නමක් වෙනස් කිරීමට / අලුතින් නමක් ඇතුලත් කිරීමට ඉල්ලීම ඉදිරිපත් වන විටදී දෙමාපියන්ගේ ඉල්ලීම් ලිපිය පමණක් ප්‍රමාණවත් වේ.

04. වයස අවුරුදු 07 සිට 16 අතර දරුවෙකුගේ නමක් සංශෝධනය සඳහා ඉල්ලීම් ඉදිරිපත් වන විටදී, පහත ලේඛන මත පදනම්ව අදාළ නම් සංශෝධනය සිදු කිරීමට කටයුතු කළ යුතු වේ.

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය
ii. දෙමව්පින්ගේ ඉල්ලීම් ලිපිය
iii. දරුවා අධ්‍යාපනය ලබන පාසලෙහි විදුහල්පතිවරයා විසින් අදාළ නම භාවිතා කිරීම පිළිබඳ එකඟතාවය දක්වන බවට නිකුත් කර ඇති ලිපිය
iv. ඉල්ලුම්කරන නම භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (තිබේනම් පමණක්)

2

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk rg@rgd.gov.lk

05. එසේම ශ්‍රී ලංකාවේ උපත ලබා පසුව මෙරට පුරවැසිභාවය ඉවත් කරගෙන ඇති පුද්ගලයන්ගේ හෝ විදේශයක ස්ථිර පදිංචිය සහිත පුද්ගලයන්ගේ නම සංශෝධන සඳහා අයදුම්පත් ලැබෙන විට, 27 වන වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය හා ඔහුගේ පුරවැසිභාවය සහිත රටෙහි හෝ ස්ථිර පදිංචිය සහිත රටෙහි අදාල නම භාවිතා කළ බවට වන ලිඛිත සාක්ෂි 03 ක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. මෙවැනි අවස්ථාවල ඇමුණුම 01 හෝ 02 ආකෘති, පුවත්පත් දැන්වීම, ග්‍රාම නිළධාරී වාර්ථාව වැනි වෙනත් ලේඛණ ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් නොකළ යුතුය.

06. ඉහත 03,04 හා 05 යන විශේෂ අවස්ථාවන්හිදී හැර සෙසු සංශෝධන සඳහා පහත ඒ ඒ කරුණට අදාළව කටයුතු කළ යුතු වේ.

07. උප්පැන්න සහතිකයක පිටපත් තුනෙහිම නමෙහි ඉස්පිලි, පාපිලි ආදියෙහි වෙනස්කම් පැවතීම, අක්ෂර වින්‍යාස දෝෂ පැවතීම, ස්ත්‍රී , පුරුෂභාවය වෙනස්වන ආකාරයෙන් නම ලියා ඇති විට හා වචන අතර පරතරය / අකුරු අතර පරතරය වෙනස් වන විට නම භාවිතා කළ බවට සෙසු ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවකදී ලේඛන වල නිරවද්‍යතාවය සනාථ කරගැනීමෙන් පසු මුල් පිටපතේ දෙවන තීරයේ අවශ්‍ය සංශෝධනය සිදු කර අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ අත්සන සමඟ දිනය සඳහන් කළ යුතු අතර, පසුව දෙවන පිටපතෙහි සංශෝධනය ඇතුලත් කිරීම සඳහා අදාල ලේඛනාගාරය වෙත උද්ධෘතයක්/ සහතික කළ පිටපතක් යොමු කළ යුතුය.

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. ඉල්ලීම් ලිපිය
ii. දිවුරුම් ප්‍රකාශය
iii. ඉල්ලුම් කරන නම භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන 03ක් ප්‍රමාණවත්)

08. උප්පැන්න සහතිකයක තුන්වන පිටපතෙහි නිවැරදිව නම සඳහන් වන නමුත් මුල් හා දෙවන පිටපත් වල නම වෙනස් වූ අවස්ථාවකදී , එනම්

1.1 නමෙහි ඉස්පිලි පාපිලි ආදියෙහි වෙනස්කම් පැවතීම
1.2 අක්ෂර වින්‍යාස දෝෂ පැවතීම
1.3 ස්ත්‍රී , පුරුෂභාවය වෙනස්වන ආකාරයෙන් නම ලියා ඇති විට
1.4 වචන අතර පරතරය / අකුරු අතර පරතරය වෙනස් වන විට
1.5 නමෙහි කොටස් අත් හැරීම හෝ අමතර කොටස් සටහන් වී තිබෙන විට

ඉහත ආකාරයේ වෙනස්කම් පවතින අවස්ථාවකදී තුන්වන පිටපත නිවැරදි වීම මත නම භාවිතා කළ බවට සෙසු ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවකදී ලේඛන වල නිරවද්‍යතාවය සනාථ කරගැනීමෙන් පසු මුල් පිටපතේ දෙවන තීරයේ අවශ්‍ය සංශෝධනය සිදු කර අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්ගේ අත්සන සමඟ දිනය සඳහන් කල යුතු අතර , පසුව දෙවන පිටපතෙහි සංශෝධනය ඇතුලත් කිරීම සඳහා අදාල ලේඛනාගාරය වෙත උද්ධෘතයක්/ සහතික කළ පිටපතක් යොමු කළ යුතුය.

ඩී. එස්. පී. සෙනෙවිරත්න
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. ඉල්ලීම් ලිපිය
ii. දිවුරුම් ප්‍රකාශය
iii. ඉල්ලුම් කරන නම භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන 03ක් ප්‍රමාණවත්)

(නොමිලයේ ලබා දුන් පිටපත තිබේනම් එය ඉදිරිපත් කළ යුතුය.1.5 කරුණ යටතේ වන සංශෝධනය සඳහා නොමිලයේ ලබා දුන් පිටපත පරීක්ෂා කර බැලීම අනිවාර්ය වේ.)

09. දෙවන තීරයේ ඇති නමට පියාගේ නම තීරයේ ඇති වාසගම ඇතුලත් කිරීම,දෙවන තීරයේ ඇති වාසගම අතහැරීම හෝ නම කෙටි කොට භාවිතා කිරීම (උදා-විලියම් යන්න විලී ලෙස)

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය
ii. දිවුරුම් ප්‍රකාශය
iii. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන 03ක් ප්‍රමාණවත්)

10. දෙමව්පියන් ජාතින් දෙකකට අයත් වන විට මවගේ හෝ පියාගේ ජාතිය නිරූපණය වන අයුරින් නම සංශෝධනය කිරීම.

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 1 හෝ 2)
iii. දිනපතා හෝ සති අන්ත පුවත්පතක පළ කරන ලද පුවත්පත් දැන්වීම
iv. දිවුරුම් ප්‍රකාශය (ජාතිය වසන් කිරීමේ අරමුණක් නොමැති බව සඳහන් විය යුතුයි.)
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. දෙමව්පියන්ගේ විවාහ සහතිකය (තිබේ නම්)
vii. ඉල්ලුම් කරන නම භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන 03ක් ප්‍රමාණවත්)

*පුවත්පත් දැන්වීම පළකර වසරක කාලයක් ඉක්මවා තිබේ නම් නම භාවිත කළ බවට වන ලේඛන වසරකට වැඩි කාලයක් භාවිත කර තිබීම අවශ්‍ය නොවන අතර,වසරකට වඩා වැඩි කාලයක් නම භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි තිබේ නම් පුවත්පත් දැන්වීම පළ කර වසරක කාලයක් ඉක්මවීම ද අවශ්‍ය නොවේ.

පී. එස්. පී. අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

11. ජාතිය වෙනසකට ලක් නොවන ආකාරයෙන් මෙතෙක් භාවිතා කළ නමෙහි සැලකිය යුතු සංශෝධනයක් සිදු කිරීම

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය(ඇමුණුම 1 හෝ ඇමුණුම 2)
iii. දිනපතා හෝ සති අන්ත පුවත්පතක පළ කරන ලද පුවත්පත් දැන්වීම (පළ කර වසරක කාලයක් ඉක්මවා තිබීම අනිවාර්ය වේ)
iv. දිවුරුම් ප්‍රකාශය
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. දෙමව්පියන්ගේ විවාහ සහතිකය(තිබේනම්)
vii. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි (ලේඛන 03 ප්‍රමාණවත්)

12. තමන්ගේ ජාතිය නිරූපණය නොවන ආකාරයෙන් නම සම්පූර්ණයෙන් සංශෝධනය කිරීම.

<u>සංශෝධනය සිදු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි</u>

i. 27 වගන්තිය යටතේ වන ප්‍රකාශ පත්‍රය
ii. තොරතුරු ලබා ගැනීමේ අයදුම් පත්‍රය(ඇමුණුම 1 හෝ ඇමුණුම 2)
iii. දිනපතා හෝ සති අන්ත පුවත්පතක පළ කරන ලද පුවත් පත් දැන්වීම (පළකර වසරක කාලයක් ඉක්මවා තිබීම අනිවාර්ය වේ)
iv. දිවුරුම් ප්‍රකාශය(ජාතිය වසන් කිරීමේ අරමුණක් නැති බව සඳහන් විය යුතුය)
v. ග්‍රාම නිලධාරී වාර්තාව
vi. ආගම වෙනස් කොට ඇති අවස්ථාවක දී ආදාල ආගමික සිද්ධස්ථානයකින් ලබා ගත් ලිපියක්
vii. අන්‍ය ආගමිකයකු මුස්ලිම් නීතිය යටතේ විවාහ වී ඇති අවස්ථාවකදී මුස්ලිම් විවාහ සහතිකය
viii. ඉල්ලුම් කරන නම වසරකට වඩා වැඩි කාලයක් භාවිත කළ බව සනාථ කෙරෙන ලියවිලි(ලේඛන 03 ක් ප්‍රමාණවත්)

13. ඉහත ඒ ඒ කරුණු යටතේ සඳහන් කෙරෙන අවශ්‍යතා සම්පූර්ණ කරණු ලබන ඕනෑම අයෙකුට නමක් සංශෝධනය කිරීම සඳහා හිමිකම ඇතත් උච්චාරණය කළ නොහැකි, ශබ්ද නගා නමක් වශයෙන් ව්‍යවහාර කළ නොහැකි අකුරු කීපයක් සංශෝධනයක් සේ සටහන් කරවා ගැනීමට උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27 වගන්තිය යටතේ ඉඩ ලබා නොදිය යුතුය. එවැනි ඉල්ලීමක් මුල් අවස්ථාවේදිම ප්‍රතික්ෂේප කළ යුතුය.

14. නමක් වෙනස් කර ගැනීමට / ඇතුලත් කර ගැනීමට ඉල්ලීමක් ලැබෙන විට එම ඉල්ලීමට හේතුව හා ඉල්ලුම්කරුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම අනිවාර්ය වේ. යෝජිත නම භාවිතා කර ඇති බවට ඉදිරිපත් කරණු ලිඛිත සාක්ෂි ලේඛණවල නිර්ව්‍යාජභාවය පිළිබඳව සොයා බැලිය යුතුය. විශේෂයෙන් ඉහත 10,11,12 යටතේ ප්‍රකාශපත්‍ර ඉදිරිපත් වන අවස්ථාවන්හිදී ඉදිරිපත් කරනු ලබන ලේඛණවලට අමතරව වාචික සාක්ෂි හා ප්‍රකාශ මගින් කරුණු සනාථ කරගැනීම මෙන්ම ඒ සම්බන්ධයෙන් සුදුසු ව්‍යවස්ථාපිත පරීක්ෂණයක් පවත්වා අදාල සංශෝධනය සඳහා අනුමැතිය ලබාදිම වඩා සුදුසු වේ. මෙම පරීක්ෂණ හැකිතාක් කෙටියෙන් අවසන් කර ඔබගේ තීරණය ලබාදිමද කළ යුතුවේ.

පී. එස්. පී. අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

15. උප්පැන්න ලේඛණ වල නම් වෙනස් කිරීම සම්බන්ධයෙන් යම් ගැටළුවක් පැණ නැගුණහොත් ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් අදාල දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත වහාම යොමුකළ යුතුය. දිස්ත්‍රික් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් එම ලේඛණ පරීක්ෂා කර හෝ තමන්ට සුදුසු යැයි හැගෙන පරික්ෂණයක් පවත්වා සිය නිර්දේශය/ අනුමැතිය එම ලේඛණ තමන් වෙත ලැබී දින 14 ක් ඇතුළත අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙත ලබාදිය යුතුවේ. ඉදිරිපත් කර තිබෙන කරුණු ගැන යම් සැකයක් තිබේ නම්, ප්‍රකාශ පත්‍රය ප්‍රතික්ෂේප කර ඒ බව අයදුම්කරු වෙත ලිඛිතව දන්වා අධිකරණ ක්‍රියාමාර්ගයකට යොමුවන ලෙස උපදෙස් ලබාදීම උචිතය. කෙසේ වෙතත් ප්‍රකාශ පත්‍රයක් ලැබී මසක් ඇතුලත එහි සියළු වැඩ අවසන් කළ යුතුය.

16. නම් සංශෝධනයට අදාල තොරතුරු ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සෑම මසකම 10 වන දිනට පෙර ඉහත 10,11,12 යටතේ සංශෝධනය කරන ලද තොරතුරු පමණක් ඇමුණුම 03 අනුව සකසා දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යොමු කළ යුතුය. දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තම දිස්ත්‍රික්කයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් යොමුකරණු ලබන තොරතුරු සෑම මසකම 15 වන දිනට පෙර rgd.civil@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ ප්‍රධාන කාර්යාලයේ සිවිල් ලියාපදිංචි කිරීමේ අංශය වෙත යොමුකළ යුතුය.

17. **2022.07.01 දින සිට මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි නම් සංශෝධනයන් සිදු කරන ලෙසත් ඒ ඒ අවස්ථාවන් යටතේ අවශ්‍ය වන ලියවිලි වලින් බැහැරව අනවශ්‍ය ලෙස ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන ලෙස දන්වමින් පාර්ශවයන් අපහසුතාවට පත් නොකරන ලෙසත් දන්වමි. එසේම පනතේ 27 වන වගන්තිය යටතේ නමක් සංශෝධන කිරීම හෝ අළුතින් නමක් ඇතුලත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේ පූර්ණ බලතල ඔබ සතුවන බැවින් ඉල්ලීමට ඉඩදීම හෝ ප්‍රතික්ෂේප කිරීම යන තීරණය ප්‍රමාදයකින් තොරව ප්‍රකාශකරුවන් වෙත දක්වන ලෙසද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.**

18. එසේම මෙම චක්‍රලේඛයේ උපදෙස් උල්ලංඝණය වන පරිදි කූට ලේඛණ සකස් කිරීම සඳහා ඍජුව හෝ වක්‍රව ආධාර අනුබල දීමක් සිදුකර ඇති බව අනාවරණය වුවහොත් ඒ සම්බන්ධව දැඩි විනය ක්‍රියා මාර්ග හා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට සිදුවන බවට වැඩිදුරටත් අවධාරණය කරමි.

19. කරුණාකර මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

පී.එස්.පී.අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්

පී. එස්. පී. අබේවර්ධන
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

පිටපත්

1. ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
2. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා
3. ජාතික බුද්ධි ප්‍රධානී , ආරක්ෂක අමාත්‍යාංශ - කාරුණික දැන ගැනීම සඳහා
4. සියළුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කාරුණික දැන ගැනීම සඳහා
5. ප්‍රධාන කාර්යාලයේ සියළුම විධායක හා මාණ්ඩලික නිලධාරීන්- කාරුණික දැන ගැනීම සඳහා

**<u>ඇමුණුම 1</u>**

**<u>උප්පැන්න සහතිකයේ දෙවන තීරයේ සඳහන් නම සංශෝධනය කිරීම.</u>**
**<u>වයස අවුරුදු 07 සිට21 තෙක්</u>**

| |
|---|
| උප්පැන්නයට අදාලව<br>දිස්ත්‍රික්කය: ............................................<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ................................................................................<br>උප්පැන්න සහතිකයේ අංකය : ............................ උපන් දිනය: ..........................................<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සම්පූර්ණ කළ යුතුය |

1.උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි :

අ. නම: ........................................................................................................

ආ. සම්පූර්ණ නම : ........................................................................................

..............................................................................................................

2. සංශෝධනයෙන් පසු භාවිත කිරීමට බලාපොරොත්තු වන නම : ..........................................

..............................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය: ...............................................................................

4. ගුවන් ගමන් බලපත්‍ර අංකය: ...............................................................................

5. රියදුරු බලපත්‍ර අංකය : ..................................................................................

(3, 4, 5 අනන්‍යතා අංක අතරින් එක් අංකයක් හෝ අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. එසේ නොමැති නම් ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය)

6. ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර:

අ. පදිංචි ලිපිනය: .............................................................................................

..............................................................................................................

ආ. ග්‍රාම නිලධාරී වසම : ...................................................................................

ඇ. ආසන්න නගරය : ........................................................................................

ඈ. දිස්ත්‍රික්කය : ...............................................................................................

(අයදුම්කරුගේ පදිංචිය හා චරිතය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය (ඩී.එස් 4) ඉදිරිපත් කල යුතුයි)

7.තාවකාලික ලිපිනය : ........................................................................................................

........................................................................................................................

8. තාවකාලික ලිපිනයෙහි පදිංචි වීමට හේතුව :.....................................................................

........................................................................................................................

9. පෙර පදිංචි ලිපිනයන්

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

........................................................................................................................

10. දුරකථන අංකය: ස්ථාවර..................................... ජංගම ..........................................

11. ඊ-මේල් ලිපිනය: ( තිබේ නම්) ....................................................................................

12. අ.) රැකියාව/වෘත්තිය : ..................................................................................................

ආ.) රැකියා/ වෘත්තිය ස්ථානයේ ලිපිනය.......................................................................

........................................................................................................................

13.මවගේ විස්තර :

අ. සම්පූර්ණ නම : ..............................................................................................

........................................................................................................................

ආ. ජාතිය : ...........................................................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................

14. පියාගේ විස්තර:

අ. සම්පූර්ණ නම : ..............................................................................................

........................................................................................................................

ආ. ජාතිය : ...........................................................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................

15.උප්පැන්න සහතිකය හිමි අයගේ විවාහක/අවිවාහක බව: ..........................................................

16. කලත්‍රයාගේ විස්තර:

අ. සම්පූර්ණ නම : ..........................................................................................

ආ. ලිපිනය : ..................................................................................................

ඇ. ජාතිය : ....................................................................................................

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය : .........................................................................

ඉ. රැකියාව :...................................................................................................

ඊ. රැකියා ස්ථානයේ ලිපිනය:...........................................................................

17. දරුවන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | වයස |
|---|---|
| .............................................................................................. | .................. |
| .............................................................................................. | .................. |
| .............................................................................................. | .................. |
| .............................................................................................. | .................. |

18.සහෝදර / සහෝදරියන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංක හා දැනට පදිංචි ලිපිනයන් පිළිබඳ විස්තර :

| නම | ජා.හැ .අංකය | ලිපිනය |
|---|---|---|
| .............................................. | ................................ | ........................................ |
| .............................................. | ................................ | ........................................ |
| .............................................. | ................................ | ........................................ |
| .............................................. | ................................ | ........................................ |

(හැකි සෑම තොරතුරක්ම ලබා දිය යුතුය)

19. මීට පෙර නම සංශෝධනය කර තිබෙනම් කලින් භාවිත කළ නම් සඳහන් කරන්න.

1.............................................................................................................................

2.............................................................................................................................

3.............................................................................................................................

20. නම සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන හේතුව පැහැදිලිව සඳහන් කරන්න.

.............................................................................................................................

.............................................................................................................................

21. ප්‍රකාශකගේ :

- අ. සම්පූර්ණ නම : ..............................................................................................
- ආ. ජාතිය : ..........................................................................................................
- ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..............................................................................
- ඈ. ලිපිනය : .........................................................................................................

22.ප්‍රකාශ කරන්නේ කවරකු වශයෙන් ද යන්න: ( මව / පියා/ භාරකරු)
(අනවශ්‍ය වචනය කපා හරින්න)

ඉහත සඳහන් තොරතුරු මා සතුව පවතින ලිඛිත සාක්ෂි අනුව සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. වැරදි හෝ අසත්‍ය තොරතුරු ලබා දීමෙන් සිදුවන සියලුම ආකාරයේ නීතිමය හෝ නීතිමය නොවන වගකීමකට මා යටත් වන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

.................................................. ..................................................

ප්‍රකාශකයාගේ අත්සන දිනය

............................................................................................................................. වන

ජාතික හැඳුනුම්පත් අංක ........................................ දරන අය මෙම පොලිස් වසමට අයත් ............

.............................................................................................................................

ලිපිනයේ ස්ථිර/තාවකාලික පදිංචිකරුවකු බව සහතික කරමි.

.................................................. ..................................................

පොලිස් ස්ථානාධිපති ( අත්සන හා නිල මුද්‍රාව) දිනය

ඇමුණුම 2

<u>උප්පැන්න සහතිකයේ දෙවන තීරයේ සඳහන් නම සංශෝධනය කිරීම.</u>

<u>වයස අවුරුදු 21 ට වැඩි</u>

| |
|---|
| උප්පැන්නයට අදාලව<br>දිස්ත්‍රික්කය: ..............................................<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ..........................................................................................<br>උප්පැන්න සහතිකයේ අංකය : .............................. උපන් දිනය: ...............................................<br>අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සම්පූර්ණ කළ යුතුය |

1.උප්පැන්න සහතිකයේ සඳහන් පරිදි :

අ. නම: ..........................................................................................................

ආ. සම්පූර්ණ නම : ..........................................................................................

2. සංශෝධනයෙන් පසු භාවිත කිරීමට බලාපොරොත්තු වන නම :

........................................................................................................................ ......

3. ජාතික හැඳුනුම්පත් අංකය: ...........................................................................

4. ගුවන් ගමන් බලපත්‍ර අංකය: ..........................................................................

5. රියදුරු බලපත්‍ර අංකය : ................................................................................

(3, 4, 5 අනන්‍යතා අංක අතරින් එක් අංකයක් හෝ අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. එසේ නොමැති නම් ඒ බවට දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුය)

6. ස්ථිර පදිංචිය පිළිබඳ විස්තර:

අ. පදිංචි ලිපිනය: ..........................................................................................

..........................................................................................................

ආ. ග්‍රාම නිලධාරී වසම : ..................................................................................

ඇ. ආසන්න නගරය : ..........................................................................................

ඈ. දිස්ත්‍රික්කය : ..............................................................................................

(අයදුම්කරුගේ පදිංචිය හා චරිතය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය (ඩී.එස් 4) ඉදිරිපත් කල යුතුයි)

7.තාවකාලික ලිපිනය : ..........................................................................................................

..........................................................................................................................................

8. තාවකාලික ලිපිනයෙහි පදිංචි වීමට හේතුව :..................................................................

..........................................................................................................................................

9. පෙර පදිංචි ලිපිනයන්

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

10. දුරකථන අංකය: ස්ථාවර.............................. ජංගම ......................................

11. ඊ-මේල් ලිපිනය: (තිබෙ නම්)..................................................................................................

12. අ.) රැකියාව/වෘත්තිය : ..........................................................................................................

ආ.) රැකියා/ වෘත්තිය ස්ථානයේ ලිපිනය

..........................................................................................................................................

..........................................................................................................................................

13.මවගේ විස්තර :

අ. සම්පූර්ණ නම : ..........................................................................................

..........................................................................................................

ආ. ජාතිය : ..........................................................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................

14. පියාගේ විස්තර:

අ. සම්පූර්ණ නම : ..........................................................................................

..........................................................................................................

ආ. ජාතිය : ..........................................................................................................

ඇ. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................................

15.උප්පැන්න සහතිකය හිමි අයගේ විවාහක/අවිවාහක බව: ...........................................................

16. කලත්‍රයාගේ විස්තර:

අ. නම : ...........................................................................................................

ආ. ලිපිනය : .....................................................................................................

ඇ. ජාතිය : .......................................................................................................

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය : ................................................................................

ඉ. රැකියාව :.......................................................................................................

ඊ. රැකියා ස්ථානයේ ලිපිනය:...................................................................................

17. දරුවන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | වයස |
|---|---|
| .................................................................................... | ................ |
| .................................................................................... | ................ |
| .................................................................................... | ................ |
| .................................................................................... | ................ |

18.සහෝදර / සහෝදරියන්ගේ නම් සහ ජාතික හැඳුනුම්පත් අංක හා දැනට පදිංචි ලිපිනයන් පිළිබඳ විස්තර :

| නම | ජා.හැ .අංක | ලිපිනය |
|---|---|---|
| ............................................. | ............................. | ......................................... |
| ............................................. | ............................. | ......................................... |
| ............................................. | ............................. | ......................................... |
| ............................................. | ............................. | ......................................... |

(හැකි සෑම තොරතුරක්ම ලබා දිය යුතුය)

19. මීට පෙර නම සංශෝධනය කර තිබෙනම් කලින් භාවිත කළ නම් සඳහන් කරන්න.

1.......................................................................................................................................

2.......................................................................................................................................

3.......................................................................................................................................

20. නම සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන හේතුව පැහැදිලිව සඳහන් කරන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

21. අයදුම්කරු සම්බන්ධයෙන් සිවිල් උසාවි නඩු තිබෙනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. (කාරණය, උසාවිය හා නඩු අංකය ඇතුලත්ව)

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු මා සතුව පවතින ලිඛිත සාක්ෂි අනුව සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. වැරදි හෝ අසත්‍ය තොරතුරු ලබා දීමෙන් සිදුවන සියලුම ආකාරයේ නීතිමය හෝ නීතිමය නොවන වගකීමකට මා යටත් වන බව ද වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

................................................ ................................................

ඉල්ලුම්කරුගේ අත්සන දිනය

.................................................................................... නම දරන හා ජාතික හැඳුනුම්පත් අංක

.......................................... දරන අය ..........................................................................................

ලිපිනයේ ස්ථිර/තාවකාලික පදිංචිකරුවකු බව හා ඉහත නම සඳහන් පුද්ගලයා මෙම පොලිස් වසමේ පදිංචි අයෙකු බවත් සහතික කරමි.

................................................ ................................................

පොලිස් ස්ථානාධිපති ( අත්සන හා නිල මුද්‍රාව) දිනය